"ජනතා හිතවාදී හා ඵලදායී රාජ්‍ය සේවයක් උදෙසා"

# ආණ්ඩුකාර ලේකම් කාර්යාලය - දකුණු පළාත
# ஆளுநர் செயலகம் - தென் மாகாணம்
# Governor's Secretariat - Southern Province

| මගේ අංකය / எனது இல. / My Number | GS/SP/EST/1/1/01 | ඔබේ අංකය / உமது இல / Your Number | | දිනය / திகதி / Date | 2025.07. 19 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව චක්‍රලේඛ දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම (2025 අයවැය අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය)**

ශීර්ෂගත කරුණ සම්බන්ධව, ඔබගේ අංක: CSS/07/13/1/vol(1) හා 2025.07.15 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපිය අනුව, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2025.06.27 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 05/2025 චක්‍රලේඛය, දකුණු පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාරව, දකුණු පළාතට අදාළ කර ගැනීම සඳහා ඔබගේ නිර්දේශ අනුව 2025.07.17 දාතමින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. එහි පිටපත් 02 අවශ්‍ය කටයුතු සඳහා මේ සමග ඔබ වෙත ඉදිරිපත් කරමි.

**කේ.පී.එස්. දමයන්ති**
පරිපාලන නිලධාරී,
ආණ්ඩුකාර ලේකම් වෙනුවට,
දකුණු පළාත.

ලිපිනය: පහළ ඩික්සන් පාර, ගාල්ල. | முகவரி: கீழ் டிக்சன் வீதி, காலி. | Address: Lower Dikson Road,Galle.
දුරකතන/ෆැක්ස්: 091-2234480 | தொலைபேசி/தொலைநகல்: 091-2234480 | Telephone/Fax: (+94)91-2234480
ඊ-මේල්: governsecspc@sltnet.lk | மின்-அஞ்சல்: governsecspc@sltnet.lk | e-mail: governsecspc@sltnet.lk
වෙබ් අඩවිය: governor.sp.gov.lk | இணையதளம்: governor.sp.gov.lk | e-mail. governor.sp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 05/2025

මගේ අංකය : EST-5/04/PCY/0041
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.06.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ විධිවිධාන අනුව භාෂා දීමනාව ගණනය කිරීම, රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය නිලධරයෙකු මුදා හැරීමේ දී දීමනා ගෙවීම සහ වැඩ බැලීමේ දීමනා හා රාජකාරී ඉටු කිරීමේ දීමනා ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

**2.1 භාෂා දීමනාව ගණනය කිරීම**

භාෂා දීමනාව හිමි නිලධරයෙකුට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව නව වැටුප් ගෙවීමට ආරම්භ කරනු ලබන 2025.04.01 දින සිට හිමි නව වැටුප් වර්ධක අගය (උපලේඛන II අනුව) භාෂා දීමනාව ගණනයට අදාළ වැටුප් වර්ධකය සඳහා අදාළ කර ගත යුතු අතර නිලධරයාගේ වැටුප් වර්ධක දිනයේ දී ද වැටුප් වර්ධක අගය වෙනස් වන්නේ නම් ඒ අනුව ද භාෂා දීමනාව සංශෝධනය කළ යුතුය.

**2.2 රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය නිලධරයෙකු මුදා හැරීමේ දී දීමනා ගෙවීම**

රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා මුදාහැර ඇති නිලධරයෙකුට දැනට ඔහුගේ නිත්‍ය තනතුරේ වැටුප මත පදනම්ව යම් වැටුපක් හෝ දීමනාවක් හෝ ගෙවනු ලබන්නේ නම් සහ ඔහුට ගෙවිය යුතු දීමනා පිළිබඳ විශේෂ සඳහනක් නොවේ නම් එහි දී එම නිලධරයාට අදාළ දීමනාව ගණනය කරනු ලබන දිනට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි උපලේඛන III අනුව නිත්‍ය තනතුරට අදාළ ගෙවන අගයත් එම වැටුප් පියවරට අදාළ උපලේඛන IIහි සඳහන් වැටුපෙන් 25%කුත් ඔහුට ගෙවිය හැකිය.

**2.3. වැඩ බැලීමේ දීමනා හා රාජකාරී ඉටු කිරීමේ දීමනා ගෙවීම**

නිසි බලධරයා විසින් නිත්‍ය තනතුරට අමතර වශයෙන් හෝ පූර්ණකාලීනව හෝ යම් තනතුරක වැඩ බැලීමට හෝ රාජකාරී ඉටු කිරීමට හෝ පත් කරනු ලැබූ නිලධරයෙකුට 2025.04.01 දින සිට 2026.12.31 දින තෙක් කාලය තුළ දී ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියේ විධිවිධාන පරිදි වැඩ බැලීමේ

අතිරේක පාරිශ්‍රමිකය සහ රාජකාරි ඉටු කිරීමේ දීමනාව ගණනය කිරීමේ දී 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II සහ උපලේඛන III භාවිතා කරමින් පහත පරිදි ගණනය කිරීම් සිදු කළ යුතු ය.

2.3.1 නිලධරයෙකු පූර්ණකාලීනව යම් තනතුරක වැඩ බැලීමට පත් කරනු ලැබූ අවස්ථාවකදී වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ලෙස ගෙවනු ලබන ගාස්තු ප්‍රමාණ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:6 වගන්තියෙහි නියමිත සීමාවන්ට යටත්ව පහත පරිදි තීරණය කළ යුතුය.

I. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:1 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ගණනය කිරීම පහත පියවර අනුව සිදු කළ යුතුය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **01 පියවර** | | | | | | |
| වැඩ බැලීමේ වැටුප | = | රා.ප.ව. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ ආරම්භක වැටුප / 2 | + | රා.ප.ව. 10/2025 උපලේඛන II අනුව වැඩ බලන තනතුරේ ආරම්භක වැටුප / 2 | + | රා.ප.ව. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ උපයාගෙන ඇති සියලුම වැටුප් වර්ධක |
| **02 පියවර** | | | | | | |
| වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය | = | වැඩ බැලීමේ වැටුප (01 පියවරේ ගණනය කිරීමට අනුව ලැබෙන අගය) | - | රා.ප.ව. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ වැටුප | | |
| **03 පියවර** | | | | | | |
| ගෙවිය යුතු අගය | = | රා.ප.ව. 10/2025 උපලේඛන III අනුව නිත්‍ය තනතුරට අදාළව ගෙවන මුදල | + | වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය (02 පියවරේ අගය) | | |

II. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:2 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ගෙවීමේ දී, නිලධරයාට නිත්‍ය තනතුරට අදාළ උපලේඛන III අනුව ගෙවන අගයට, උපලේඛන II හි වන වැටුප් පරිමාණයෙහි වැටුප් වර්ධක දෙකකට සමාන මුදලක් එකතු කළ විට ලැබෙන මුදල හෝ වැඩ බලන තනතුරට අදාළව උපලේඛන II අනුව හිමි වැටුප් පරිමාණයේ උපරිම වැටුප යන දෙකෙන් කුමක් හෝ අඩු මුදල ගෙවිය යුතුය.

III. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:3 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය තීරණය කිරීමේ දී, නිලධරයාට නිත්‍ය තනතුරේ උපලේඛන II අනුව හිමි වැටුප, වැඩ බලන තනතුරට අදාළ උපලේඛන II හි සඳහන් ආරම්භක වැටුපට වඩා අඩු නම් වැඩ බලන තනතුරේ

උපලේඛන II හි සඳහන් ආරම්භක වැටුපට අදාළ උපලේඛන III හි සඳහන් ගෙවන අගය ගෙවිය හැකිය.

IV. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:4 වගන්තියේ විධිවිධාන අනුව වැඩ බැලීමේ පාරිශ්‍රමිකය තීරණය කිරීමේ දී, නිලධරයාට වැඩ බලන තනතුරට උපලේඛන II අනුව හිමි වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙන් 25% ක් සමඟ ඔහුගේ නිත්‍ය තනතුරට අදාළව උපලේඛන III අනුව ගෙවන අගය ගෙවිය යුතු ය.

2.3.2 ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:3 වගන්තියේ විධිවිධාන පරිදි රාජකාරී ඉටු කිරීමේ දීමනාව ගෙවීමේ දී නිලධරයා එම තනතුරට වැඩ බැලීමට පත් කරනු ලැබී නම් ඔහුට ඉහත 2.3.1හි I, II, III හෝ IV හෝ පරිදි ගණනය කර ගෙවනු ලබන අතිරේක පාරිශ්‍රමිකයෙන් 2/3 ප්‍රමාණයක් ගෙවිය යුතු ය.

03. තවද, 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 මඟින් ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමක් සිදු කර නොමැති බැවින්, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියේ සඳහන් වැඩ බැලීමේ වැටුප හෝ රාජකාරී ඉටු කිරීමේ දීමනාව හෝ ගෙවීම කල යුතු අනුපාතයන්හි කිසිදු සංශෝධනයක් සිදු වී නොමැති බව ද කාරුණිකව දන්වා සිටිමි.

04. මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත මෙම චක්‍රලේඛ ලිපිය නිකුත් කෙරේ.

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk

මෙම රාජ්‍ය පරිපාලන / රාජ්‍ය චක්‍රලේඛ 05 / 2025 චක්‍රලේඛය / උපදෙස් ලිපිය නිකුත් කළ දින සිට
දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීම සඳහා
ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය 2025/07/17
දින ලබා දී ඇති බව සහතික කරමි.
ආණ්ඩුකාර ලේකම් / සහකාර ලේකම් / ...

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 05/2025

මගේ අංකය : EST-5/04/PCY/0041
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2025.06.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛ විධිවිධාන අනුව භාෂා දීමනාව ගණනය කිරීම, රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය නිලධරයෙකු මුදා හැරීමේ දී දීමනා ගෙවීම සහ වැඩ බැලීමේ දීමනා හා රාජකාරී ඉටු කිරීමේ දීමනා ගෙවීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

### 2.1 භාෂා දීමනාව ගණනය කිරීම

භාෂා දීමනාව හිමි නිලධරයෙකුට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව නව වැටුප් ගෙවීමට ආරම්භ කරනු ලබන 2025.04.01 දින සිට හිමි නව වැටුප් වර්ධක අගය (උපලේඛන II අනුව) භාෂා දීමනාව ගණනයට අදාළ වැටුප් වර්ධකය සඳහා අදාළ කර ගත යුතු අතර නිලධරයාගේ වැටුප් වර්ධක දිනයේ දී ද වැටුප් වර්ධක අගය වෙනස් වන්නේ නම් ඒ අනුව ද භාෂා දීමනාව සංශෝධනය කළ යුතු ය.

### 2.2 රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා රාජ්‍ය නිලධරයෙකු මුදා හැරීමේ දී දීමනා ගෙවීම

රාජ්‍ය ප්‍රතිපත්තිමය හේතු මත විධිමත් පරිදි රාජ්‍ය සේවයෙන් පිටස්තර සේවයක් සඳහා මුදාහැර ඇති නිලධරයෙකුට දැනට ඔහුගේ නිත්‍ය තනතුරේ වැටුප මත පදනම්ව යම් වැටුපක් හෝ දීමනාවක් හෝ ගෙවනු ලබන්නේ නම් සහ ඔහුට ගෙවිය යුතු දීමනා පිළිබඳ විශේෂ සඳහනක් නොවේ නම් එහි දී එම නිලධරයාට අදාළ දීමනාව ගණනය කරනු ලබන දිනට 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි උපලේඛන III අනුව නිත්‍ය තනතුරට අදාළ ගෙවන අගයත් එම වැටුප් පියවරට අදාළ උපලේඛන IIහි සඳහන් වැටුපෙන් 25%කුත් ඔහුට ගෙවිය හැකිය.

### 2.3. වැඩ බැලීමේ දීමනා හා රාජකාරී ඉටු කිරීමේ දීමනා ගෙවීම

නිසි බලධරයා විසින් නිත්‍ය තනතුරට අමතර වශයෙන් හෝ පූර්ණකාලීනව හෝ යම් තනතුරක වැඩ බැලීමට හෝ රාජකාරී ඉටු කිරීමට හෝ පත් කරනු ලැබූ නිලධරයෙකුට 2025.04.01 දින සිට 2026.12.31 දින තෙක් කාලය තුළ දී ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියේ විධිවිධාන පරිදි වැඩ බැලීමේ

අතිරේක පාරිශ්‍රමිකය සහ රාජකාරී ඉටු කිරීමේ දීමනාව ගණනය කිරීමේ දී 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II සහ උපලේඛන III භාවිතා කරමින් පහත පරිදි ගණනය කිරීම සිදු කළ යුතු ය.

2.3.1 නිලධරයෙකු පූර්ණකාලීනව යම් තනතුරක වැඩ බැලීමට පත් කරනු ලැබූ අවස්ථාවකදී වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ලෙස ගෙවනු ලබන ගාස්තු ප්‍රමාණ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:6 වගන්තියෙහි නියමිත සීමාවන්ට යටත්ව පහත පරිදි තීරණය කළ යුතුය.

I. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:1 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ගණනය කිරීම පහත පියවර අනුව සිදු කළ යුතුය.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **01 පියවර** | | | | | | |
| වැඩ බැලීමේ වැටුප | = | රා.ප.ච. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ ආරම්භක වැටුප / 2 | + | රා.ප.ච. 10/2025 උපලේඛන II අනුව වැඩ බලන තනතුරේ ආරම්භක වැටුප / 2 | + | රා.ප.ච. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ උපයාගෙන ඇති සියලුම වැටුප් වර්ධක |
| **02 පියවර** | | | | | | |
| වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය | = | වැඩ බැලීමේ වැටුප (01 පියවරේ ගණනය කිරීමට අනුව ලැබෙන අගය) | - | රා.ප.ච. 10/2025 උපලේඛන II අනුව නිත්‍ය තනතුරේ වැටුප | | |
| **03 පියවර** | | | | | | |
| ගෙවිය යුතු අගය | = | රා.ප.ච. 10/2025 උපලේඛන III අනුව නිත්‍ය තනතුරට අදාළව ගෙවන මුදල | + | වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය (02 පියවරේ අගය) | | |

II. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:2 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය ගෙවීමේ දී, නිලධරයාට නිත්‍ය තනතුරට අදාළ උපලේඛන III අනුව ගෙවන අගයට, උපලේඛන II හි වන වැටුප් පරිමාණයෙහි වැටුප් වර්ධක දෙකකට සමාන මුදලක් එකතු කළ විට ලැබෙන මුදල හෝ වැඩ බලන තනතුරට අදාළව උපලේඛන II අනුව හිමි වැටුප් පරිමාණයේ උපරිම වැටුප යන දෙකෙන් කුමක් හෝ අඩු මුදල ගෙවිය යුතුය.

III. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:3 හි සඳහන් විධිවිධාන අනුව වැඩ බැලීමේ අතිරේක පාරිශ්‍රමිකය තීරණය කිරීමේ දී, නිලධරයාට නිත්‍ය තනතුරේ උපලේඛන II අනුව හිමි වැටුප, වැඩ බලන තනතුරට අදාළ උපලේඛන II හි සඳහන් ආරම්භක වැටුපට වඩා අඩු නම් වැඩ බලන තනතුරේ

උපලේඛන II හි සඳහන් ආරම්භක වැටුපට අදාළ උපලේඛන III හි සඳහන් ගෙවන අගය ගෙවිය හැකිය.

IV. ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:5:4 වගන්තියේ විධිවිධාන අනුව වැඩ බැලීමේ පාරිශ්‍රමිකය තීරණය කිරීමේ දී, නිලධරයාට වැඩ බලන තනතුරට උපලේඛන II අනුව හිමි වැටුප් පරිමාණයේ ආරම්භක වැටුපෙන් 25% ක් සමඟ ඔහුගේ නිත්‍ය තනතුරට අදාළව උපලේඛන III අනුව ගෙවන අගය ගෙවිය යුතු ය.

2.3.2 ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12:3 වගන්තියේ විධිවිධාන පරිදි රාජකාරී ඉටු කිරීමේ දීමනාව ගෙවීමේ දී නිලධරයා එම තනතුරට වැඩ බැලීමට පත් කරනු ලැබී නම් ඔහුට ඉහත 2.3.1හි I, II, III හෝ IV හෝ පරිදි ගණනය කර ගෙවනු ලබන අතිරේක පාරිශ්‍රමිකයෙන් 2/3 ප්‍රමාණයක් ගෙවිය යුතු ය.

03. තවද, 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 මඟින් ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කිරීමක් සිදු කර නොමැති බැවින්, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වගන්තියේ සඳහන් වැඩ බැලීමේ වැටුප හෝ රාජකාරී ඉටු කිරීමේ දීමනාව හෝ ගෙවීම් කල යුතු අනුපාතයන්හි කිසිදු සංශෝධනයක් සිදු වී නොමැති බව ද කාරුණිකව දන්වා සිටිමි.

04. මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත මෙම චක්‍රලේඛ ලිපිය නිකුත් කෙරේ.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011 2 673 330
ෆැක්ස් : 011 2 692 158
විද්‍යුත් ලිපිනය : ade-v@pubad.gov.lk


මෙම රාජ්‍ය පරිපාලන/ රාජ්‍ය ....චක්‍රලේඛ ඩ්‍රි......05./2025
..................චක්‍රලේඛය / උපදෙස්
ලිපිය .....නිකුත් කළ..... දින සිට
දකුණු පළාත් [illegible]ට අදාල කර ගැනීම සඳහා
ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය....2025/07/17.....
දින ලබා දී ඇති බව සහතික කරමි.
..................................................
ආණ්ඩු[illegible] ලේකම් / සහකාර ලේකම් / [illegible]